# මධ්‍යම පරිසර අධිකාරිය
## மத்திய சுற்றாடல் அதிகாரசபை
## Central Environmental Authority

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. } CEA/06/EPU/PC&PR/09/2024

ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. }

දිනය / திகதி / Date } 2024.12.17

# මාධ්‍ය නිවේදනය

## මධ්‍යම පරිසර අධිකාරියට නව අධ්‍යක්ෂ ජනරාල්වරයෙක්...

මධ්‍යම පරිසර අධිකාරියේ නව අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පද්මසිරි මූණමලේ මහතා ඊයේ (16) වැඩ භාර ගත්තේය. ඒ මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධිධාරියෙකි. 1995 වර්ෂයේ සිට පරිසර විෂය ක්ෂේත්‍රයට අදාළව කටයුතු කරන පද්මසිරි මූණමලේ මහතා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල ද දේශීය සහ විදේශීය පාරිසරික ව්‍යාපෘතිවල ද පරිසර කළමනාකරණයට අදාළව වසර 29ක පමණ කාලයක් සේවය කර ඇත. නව අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩ භාරගැනීමේ අවස්ථාවට මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති මහාචාර්ය තිලක් හේවාවසම් මහතා ඇතුළු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු සහභාගී වූහ.

වැඩභාර ගැනීමෙන් අනතුරුව කාර්යමණ්ඩලය ඇමතූ පද්මසිරි මූණමලේ මහතා; පරිසර කළමනාකරණය සහ නියාමනය සම්බන්ධයෙන් මෙරට පිහිටි ප්‍රධානත ම ආයතනයක් වන මධ්‍යම පරිසර අධිකාරියේ සේවය කිරීමට ලැබීම සතුටට කරුණක් මෙන් ම එය වගකීමක් ලෙස තමන් සලකන බවත් මෙරට පරිසර නියාමනය සහ සංරක්ෂණ කාර්යය තවදුරටත් ශක්තිමත් කළ හැකි ආකාරයට සභාපතිතුමන් ඇතුළු නිලධාරීන් සමඟ එක්ව කටයුතු කිරීමට තමන් අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කළේය. පරිසර සංරක්ෂණ කාර්යයේ අවශ්‍යතාව සියලු පුරවැසියන්ට හඳුනාගැනීමට සැලැස්විය යුතු බව ද අප සැම එක්ව වගකීමක් සහ වගවීමක් ලෙස සළකා එම කාර්යය ඉටු කිරීම ඉතා වැදගත් බව ද ඒ සඳහා සියලු පාර්ශවයන්ගේ සහය ලබාගනිමින් අප කටයුතු කළ යුතු බව ද අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩිදුරටත් පැවසුවේය.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

මහාචාර්ය තිලක් හේවාවසම්
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය


| Chairman | Tel : 2872361, 2872348 Fax : 2872347 | Director General | Tel : 2872359 Fax : 2872608 | General Office | Tel : 2872278, 2873447, 2872419, 2873448, 7877277-280 | Complaint : 2888999 |
|---|---|---|---|---|---|---|

| D. D. G | HRD. Admin. & Finance | Envt. Pollution Control | Envt. Mgt. & Assess. | Envt. Edu. & Awareness | Waste Mgt. | Regional Oper. |
|---|---|---|---|---|---|---|
| | Tel : 2865296 Fax : 2877515 | Tel : 2873453 Fax : 2872605 | Tel : 2872388 Fax : 2872296 | Tel : 2872297 Fax : 2872609 | Te. 2872409 Fax : 2882152 | Tel : 2872370 |




පරිසර අමාත්‍යාංශය | சுற்றாடல் அமைச்சு | Ministry of Environment